**අඹගමුව ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඹගමුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. **මා විසින් තවදුරටත්,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.188,601 ක පොදු ගබඩා තොග ශේෂය ගිණුම්ගත කර නොතිබුණු අතර බේල් යන්ත්‍රයක වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ රු.60,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.65,950 ක ප්‍රමාද ගාස්තු ගිණුම්ගත කර නොතිබුණු අතර 2022 දෙසැම්බර් 20 දිනැති 5152 ලදුපතින් තැන්පත් කරන ලද රු.15,000 ක් රු.150,000 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් තැන්පතු රු.135,000 ක් වැඩියෙන් දැක්වුණි. | - එම - | - එම - |
| (ඇ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු ලෙසට ගිණුම්ගත කර තිබුණු උසාවි දඩ රු. 2,634,643 ක අධි ඇස්තමේන්තු කිරීම සමුච්චිත අරමුදලට ගලපා ඉවත් කර නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ දී අදාල වටිනාකම ගිණුම්ගත කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.28,309,671 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඉ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.160,839 ක දැන්වීම් පුවරු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු.78,739 ක් වැඩියෙන් දැක්විණි. සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු රු.344,100 ක දැන්වීම් පුවරු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | පොදු තැන්පත් යටතේ ගිණුම්ගත කළ යුතු ව්‍යාපෘති 25 කට අදාළ රු.4,176,046 ක රැඳවුම් මුදල් කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023 ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කර ගන්නා බව | කර්මාන්ත රැඳවුම් මුදල් තැන්පතු යටතේ ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.146,031,044 ක ස්ථාවර වත්කම් කාර්මික නිළධාරී විසින් එකතුව රු.567,957,750 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ඒ සඳහා සභා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | කාර්මික නිළධාරී ඇතුළුව නිළධාරීන් කිහිප දෙනෙකු ඇතුළත් වන සේ තක්සේරු මණ්ඩලයක් පත් කර ගැනීමට අදාලව සභා තීරණයක් ගෙන ඇති අතර,මෙම තාවකාලික තක්සේරුව ලබා ගැනීමට මෙම වර්ෂය තුළදී කටයුතු කරන බව | විධිමත් තක්සේරුවකින් හා අනුමැතියකින් යුතුව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

-------------------------------------------

| විගණන නිරීක්ෂනය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 884,369 ක් වූ ආයුර්වේද හා පොදු ගබඩා තොග, තොග ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි වීය. | ඉදිරියේදී එම වරද නිවැරදි කර නිකුත් කිරීම් වටිනාකම විෂය භාර නිළධාරී මඟින් ලබාගෙන ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කරන බව | තොග ලේඛන පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 4 දරණ ජාතික පාරිසරික පනත | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර 12 කට පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | අදාළ කටයුතු ඉටු කරමින් පවතින බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු පනතේ 20 වගන්ති<br>----------------------- | | | |
| 140 (1) වගන්තිය | වසර 13 කින් වරිපනම් දේපල තක්සේරු කර නොතිබුණි. | විකල්ප ක්‍රියාමාර්ගයක් මඟින් තක්සේරුව සිදුකර වරිපනම් බදු අය කිරීම සම්බන්ධව සහකාර කොමසාරිස්වරයා සමග සාකච්ජා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බව | - එම - |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------ | | | |
| මු.රෙ. 571 (3) | 2014 වර්ෂයේ සිට පැවත එන කාලය ඉකුත් වූ රු.320,120ක තැන්පතු 10 ක් නියාදනය කර නොතිබුණි. | මෙම පොදු තැන්පත් ලේඛනයෙහි සඳහන් පුද්ගලයින් සඳහා ලිපි යැවීමට කටයුතු කර ඇති බව | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ලෙස රු.935,678 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේ දී මෙම ගැටළුව නිරාකරණය කරන බව | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,894,414 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,540,126 ක් විය

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,830,000 | 3,904,609 | 3,912,126 | 1,843,006 | 7,554,000 | 3,051,629 | 3,284,596 | 1,850,522 |
| (ii) | කඩ කුලී | 12,604,000 | 3,519,726 | 3,619,364 | 2,110,227 | 17,550,000 | 3,589,308 | 5,400,576 | 2,209,866 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,751,000 | 1,807,338 | 1,807,339 | 182,420 | 2,251,000 | 1,817,803 | 2,111,611 | 182,421 |
| (iv) | වෙනත් ආදායම් | 105,815,221 | 24,000,000 | 19,325,222 | 51,427,930 | 44,485,000 | 48,185,000 | 35,760,339 | 46,753,153 |
| | | 126,000,221 | 33,231,673 | 28,664,051 | 55,563,583 | 71,840,000 | 56,643,740 | 46,557,122 | 50,995,962 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,125,468 ක වරිපනම් හිඟ ශේෂයක් පැවතුණ අතර, ඉන් වරිපනම් දේපල 186 කින් වසර 01 ත් 05 ත් අතර කාලයකට අදාළ ශේෂය රු.341,219 ක් හා වරිපනම් දේපල 82 කින් වසර 05වැඩි ශේෂ එකතුව රු.503,402 ක් විය. | නැවත වරිපනම් සීමාව ගැසට් කිරීම මඟින් එම දේපළ වල බිල් කිරීම නැවත ආරම්භ කිරීමටත් පවතින හිඟයන් අය කර ගැනීමටත් කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ආ) | කුලී | | |
| i. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ කඩකුලී රු.964,292 ක් වූ අතර ඉන් වසර 01 ට වැඩි හිඟ කඩකුලී හිමියන් 13 දෙනෙකුගෙන් රු.580,595 ක් අයකරගෙන නොතිබුණි. | රු.101,672 ක් මේ වනවිට අය කර ඇති බවත්, හිඟ අය කරගන්නා බව | - එම - |

| | | | |
|---|---|---|---|
| ii. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවිය යුතු ටෙන්ඩර් කුලී රු.1,188,102 ක් වූ අතර වසර 02 සිට වසර 13 ක කාල පරාසයකට අදාළ රු.1,066,644 ක් අයකරගෙන නොතිබුණි. | රු.101,672 ක් මේ වනවිට අය කර ඇති බවත්, හිඟ අය කර ගන්නා බව | - එම - |
| (ඈ) | වෙනත් ආදායම්<br>------------------ | | |
| i. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.551,383 ක ජල ගාස්තු හිඟ ශේෂයක් පැවති අතර ඉන් මාස 01සිට මාස 60 දක්වා කාලයකට අදාළ ජල පාරිභෝගිකයින් 55 දෙනෙකුගෙන් ශේෂය රු 163,551.ක් අයකරගෙන නොතිබුණි. | පෙර වර්ෂ වලට අදාල හිඟ ජල ගාස්තු අය කර ගැනීම සඳහා ප්‍රමුඛතාව ලබා දීමට කටයුතු කරන බව | - එම - |
| ii. | බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂණයේදී වර්ග මීටර් 501.4 කට අදාළ රු.126,417 ක දැන්වීම් පුවරු ගාස්තු අයකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මෙන් යෝජනා කර ඇති පරිදි ආදායම් රැස් කිරීමේ කටයුතු සිදු කරන බව | හිඟ ආදායම් අය කරගත යුතුය. |
| (ඇ) | බලපත්‍ර ගාස්තු<br>----------------- | | |
| | නියැදි පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ආයතන 31 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.31,000 ක් අයකර නොතිබුණි. | 2023 වර්ෂයේ දී අදාල අය කිරීම් කරනු ලබන බව | - එම - |
| (ඉ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>------------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 3,957,007 ක් හා මුද්දර ගාස්තු රු.47,470,923 ක් විය. | 2022 වර්ෂය සඳහා උසාවි දඩ ලෙස රු.696,815 ක් ද මුද්දර ගාස්තු ලෙස රු.5,720,270 ක් ද ලැබී ඇත. | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 27 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරන බව | මාර්ග ගැසට් කර ඉන්නේට්‍රි ලේඛනයේ ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සංචාරක අමාත්‍යාංශය විසින් ඇබර්ඩීන් ඇල්ල අසල නැරඹුම් මැදිරිය හා පඩිපෙල ඉදිකර සභාව වෙත පවරා දී තිබුණද, සෞන්දර්ය හා සංස්කෘතික වටිනාකම් ඇති මෙම ස්ථානයේ සංචාරකයින්ගේ පහසුව පිණිස වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම, අතුරු ව්‍යවස්ථා පනවා ටිකට් පතක් නිකුත් කර හෝ ටෙන්ඩර් පටිපාටිය මගින් ටිකට්පත් අලෙවි කිරීම මගින් සභාවට ආදායමක් උපයා ගැනීමට හා බෝට්ටු සේවාවව විධිමත් කිරීම සහ සංචාරකයින්ගේ ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි | 2023 වර්ෂයේ අදාළ කටයුතු සිදු කරන බව | වත්කම් නසි ලෙස නඩත්තු කර ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර ගෙවුම් තුළ ඇතුළත් 1995 සිට 2021 කාලයට අදාළ රු.1,757,888 ක අත්තිකාරම් ගිණුම් ශේෂ 09 ක් හා 2013 සිට පැවත එන රු.102,750 ක පෙර ගෙවුම් තැන්පතු නිරවුල් කර නොතිබුණි. | 2023 අවසන් ගිණුමේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා කාල පරාසයට අදාළ රු.47,823,809 ක ණයහිමි ශේෂයන් 110 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී, නිවැරදි කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ බැකෝ යන්ත්‍රය 2022 මාර්තු 19 දින සිට 2022 අප්‍රේල් 29 දින දක්වා රිකාටන් කසළ අංගනයේ ඩීසල් නොමැතිව නවතා තැබූ බවට ධාවන සටහනේ සටහන්ව තිබුණද, කසළ මධ්‍යස්ථානයේ ලේඛන අනුව රථය 2022 මාර්තු 14 දින එයින් පිටතට රැගෙන ගොස් 2022 අප්‍රේල් 29 තෙක් දින 45 ක් බැකෝ යන්ත්‍රය අවභාවිතා කර තිබුණි. | මාර්තු 18 වන දින හා 19 දිනයන් වල JCB යන්ත්‍රය කසළ අංගනයේ සේවය කර ඇති බව හා මාර්තු 19 දිනෙන් පසුව අප්‍රේල් 29 දක්වා යන්ත්‍රය ක්‍රියාත්මක කර නොමැති බව | විධිමත් අනුමැතියකින් යුතුව යන්ත්‍රය ධාවනය කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අඹගමුව ප්‍රාදේශීය සභාව පරිහරණය කරන ඉඩම් කොටස් 35 ක අයිතිය පවරාගෙන නොතිබුණු අතර වටවල පොදු ඉඩම අනවසරයෙන් බාහිර පාර්ශවයන් භාවිතා කර තිබුණි. | පවරා ගැනීම සඳහා කටයුතු ඉටු කරන අතර අනවසර පිවිසුම් කරුවන් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතින බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුය. |
| (ආ) | පුස්තකාල නිවාස ගොඩනැගිලි හා ආයුර්වේද ගොඩනැගිල්ල ඇතුළත් ගොඩනැගිලි 06 ක් අළුත්වැඩියා කිරීම් හෝ නඩත්තු කිරීම්වලින් තොරව අබලන්ව පැවතුණි. | 2023 වර්ෂයේ ස්ථාවර වත්කම් නඩත්තු හා අළුත්වැඩියා කිරීම් යටතේ මෙම කටයුතු සිදු කරන බව | සභා දේපල අළුත්වැඩියා කර නඩත්තු කළ යුතුය. |

## 3. 5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගුණානන්දගම පාලම ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.485,000 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධව 2023 පෙබරවාරි 03 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී පාලමේ දෙපස බැම්වලින් එක් බැම්මක් මධ්‍යයෙන් සම්පූර්ණයෙන්ම පුපුරා යාම නිසා පාලම භාවිතා කළ නොහැකිව පැවතුණි. | අධික වර්ෂාව හේතුවෙන් මෙම ප්‍රදේශයට බලපෑ හදිසි ආපදා තත්ත්වයක් මත සිදු වූ භෞතික වෙනස්වීම හේතුවෙන් මෙම ඉදි කිරීමට හානි වී ඇති බව | ස්ථානීය පරීක්ෂාවට අනුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්ය මණ්ඩල තනතුරු 15 ක පුරප්පාඩු 26 ද, සංවර්ධන නිළධාරි තනතුරේ අතිරික්ත 02 ක් පැවතුණ අතර 25/2014 චක්‍රලේඛය අනුව අනුමත නොවූ සනීපාරක්ෂක කම්කරු තනතුරේ සේවකයින් 05 ක් සේවයේ යොදවා තිබුණි. ආදායම් පරීක්ෂක තනතුරු තුනක් පුරප්පාඩු වී පැවතුණි. මේ හේතුවෙන් සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්ය කාර්යක්ෂමව කරගෙන යාමට බාධාවක් වී තිබුණි. | පුරප්පාඩු පිළිබඳ දැනුම් දී ඇතත් මෙතෙක් නිළධාරියෙක් ලබාදී නොමැති බව | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.7 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.3,475,000 ක වාහන 04 ක් ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක් හා ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් කාර් රථයක් 2015 වර්ෂයට පෙර සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි . | එක් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර ට්‍රැක්ටර් රථය හා වතුර බවුසරය වෙන්දේසි කිරීමට කටයුතු කරන බව | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කළ ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කාර්යයන් 07 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්ම තුළින් යෝජනා කර ඇති මෙම කරුණු ක්‍රියාත්මක කරමින් පවතින බව | ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයය න් 06 ක සියයට 09 සිට සියයට 53 දක්වා ද වියදම් විෂයයන් 08 ක සියයට 03 සිට සියයට 100 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී අයවැය ප්‍රතිපාදන අනුව කටයුතු කරන බව | අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක පිහිටුවාගෙන නොතිබුණි. | 2023 වර්ෂය තුළ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු සිදු කරන බව | ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතුය. |